tamilguru.lk

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2474/19 - 2026 පෙබරවාරි මස 02 වැනි සඳුදා - 2026.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා
උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය - 2026

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා 2023.02.10 දිනට රාජ්‍ය සේවයේ නියුතුව නොසිටි උපාධිධාරීන් හා **සටහන 3** මගින් ආවරණය වන උපාධිධාරීන් බඳවා ගැනීමට සුදුසුකම්ලත් ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 පෙබරවාරි මස 20 වන දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 මාර්තු මස 05 වන දින ප.ව. 09.00 ට අවසන් වේ.

**සටහන 1**

අයදුම්කරු විසින් යොමු කරනු ලබන අයදුම්පතෙහි දෘඩ පිටපත භාගත කරගෙන තම අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු වෙතින් සහතික කරවාගෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

**සටහන 2**

මෙම ගැසට් නිවේදනය මඟින් අයදුම්පත් කැඳවනු ලබනුයේ රජයේ සේවයේ නියුතු නොවන උපාධිධාරීන්ගෙන් වන බැවින්, අංක 2317 දරන 2023.01.27 දිනැති ගැසට් පත්‍රයේ "දිවයිනේ ජාතික පාසල් හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය - 2023" මැයෙන් පළ කරන ලද *ගැසට් නිවේදනයට* අනුව හා අංක 2474/18 දරන 2026.02.02 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* "දිවයිනේ ජාතික පාසල් හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය - 2023(2026)" මැයෙන් පළ කරන ලද ගැසට් නිවේදනයට අනුව අයදුම් කරන ලද **අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනය ප්‍රකාරව අයදුම් කිරීමට සුදුසුකම් ලබනු නොලැබේ.**

1A - G 46217 — 04 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

tamilguru.lk



**සටහන 3**

ඉහත **සටහන 2** මගින් දක්වන *ගැසට්* නිවේදන මඟින් සුදුසුකම් සලකා බලන ලද 2023.02.10 දිනට අයදුම් කිරීමට සුදුසුකම් නොලබන, එහෙත්, 2023.02.10 දිනට වයස අවුරුදු 40 නොඉක්මු වූ අය අතරින්, 2023.02.10 දිනට පසු හා 2025.06.30 දිනට පෙර උපාධි සුදුසුකම් සම්පූර්ණ කළ 2023.02.10 දිනට රාජ්‍ය සේවයේ නියුතු වූ හා මේ දක්වා රාජ්‍ය සේවයේ නිරත වන උපාධිධාරීන්ට ද; හා 2023.02.10 දිනට රාජ්‍ය සේවයේ නියුතුව සිටියද මේ වන විට විධිමත් අනුමැතියක් මත එම තනතුරෙන් ඉල්ලා අස්වී සිටින 2025.06.30 දිනට ප්‍රථම උපාධි සුදුසුකම සම්පූර්ණ කරන ලද පිරිසට ද මෙම *ගැසට්* නිවේදනය ප්‍රකාරව අයදුම්කිරීමට බාධාවක් නොවේ.

02. **සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:**

2.1 මේ සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් මෙම *ගැසට්* නිවේදනයේ 10.1 වගන්තිය පරිදි ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ.

2.2 ලිඛිත තරග විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතා අනුපිළිවෙළට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණය (02) කට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම *ගැසට්* නිවේදනයේ 10.2 වගන්තිය පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ නාමලේඛනය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. (සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**සටහන 4**

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.1. වගන්තිය අනුව ලිඛිත තරහ විභාගය සමත්වීමට අවශ්‍ය අවම ලකුණු හෝ ලබා තිබේ නම් පමණක් ඉල්ලුම් කරන පාසල් ගණයට, මාධ්‍යයට හා විෂයට අදාළව, පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක උපරිමයක් දක්වා පූර්ණ කාලීන ආබාධ සහිත පුද්ගලයන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් වීමට හිමිකම් ලබයි. එහිදී ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 4 ඡේදයෙහි සඳහන් අපේක්ෂිත කාර්යය ඉටු කිරීම සඳහා ශාරීරික යෝග්‍යතාවන් සහිත ද යන්න තහවුරු කිරීමට අදාළව අයදුම්කරු විසින් මෙම *ගැසට්* නිවේදනයේ **සටහන** 7 පරිදි ඉදිරිපත් කරන වෛද්‍ය සහතික ද සලකා ඒ බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් ද තහවුරු කරයි නම්, ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබා දීම සිදුකරනු ලබයි.

2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් සපුරනු ලැබූ අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ 10.3 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය/අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත සෘජුව යොමු කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලබන අතර අයදුම්කරුවන් විසින් පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්වකීය මනාපය ප්‍රමුඛතා අනුපිළිවෙළින් දැක්විය යුතුය.

2.4 ප්‍රායෝගික පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ, ඉල්ලුම් කර ඇති භාෂා මාධ්‍යය, විෂයය හා පාසල් වර්ගය අනුව පාසල් පාදකව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

2.5 මෙම *ගැසට්* නිවේදනයට අදාළ පත්වීම් විෂයයන්හි පුරප්පාඩු **උපලේඛනය 05හි** සඳහන් වේ. උපලේඛනයේ සඳහන් ගුරු පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

**සටහන 5**

එකම පාසලට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් කිහිප දෙනකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක දී පාසල් සඳහා ස්ථාන ගත කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින්/ අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

***සැලකිය යුතුයි:*** - මෙම *ගැසට්* නිවේදනය **සටහන** 4 හි සඳහන් කරන ලද පූර්ණ කාලීන ආබාධ සහිත අයදුම්කරුවන් හට ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.2 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයේදී අවම ලකුණු හෝ ලබා ඇති නම් එම පූර්ණ කාලීන ආබාධ සහිත අයදුම්කරුවන් අතුරින් ලකුණු අනුපිළිවෙලට සුදුසුකම් ලබන අයදුම්කරුවන් හට ඉල්ලුම් කරන පාසල් ගණයට, මාධ්‍යයට හා විෂයට අදාළව, පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක උපරිමයක් නොඉක්මවන පරිදි බඳවා ගැනීම සිදුකරන අතර, ඔවුන් පාසල් සඳහා ස්ථාන ගත කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින්/ අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2.6 මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ පාසල් පාදක පුරප්පාඩු පදනම් කරගනිමින් වන බැවින් වසර පහ (05) ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

2.7 මෙම බඳවා ගැනීමේ දී ජාතික හා පළාත් පාසල් වශයෙන් වෙන් වෙන් වශයෙන් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.8 ඔබට ජාතික පාසල්, පළාත් පාසල් යන පාසල් වර්ග දෙක (02) සඳහා ම හෝ එක් පාසල් වර්ගයක් සඳහා හෝ තම මනාපය ප්‍රකාශ කළ හැකිය. ඒ බව අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

2.9 ජාතික පාසල්/පළාත් පාසල් හා පළාත් පාසල් සඳහා පමණක් මනාපය ප්‍රකාශ කරනු ලබන අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල ඔවුන් විසින් අයදුම්පතෙහි සඳහන් කරනු ලබන ස්ථිර පදිංචි පළාත අනුව ඒ ඒ පළාත් සඳහා යොමු කරනු ලැබේ. ස්ථිර පදිංචි පළාත ලෙස සැලකෙනුයේ 2025 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය අනුව ලියාපදිංචි පළාත වේ. (ජාතික පාසල් සඳහා පමණක් අයදුම්කරනු ලබන අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල පළාත් සඳහා යොමු කරනු නොලැබේ.)

2.10 සෑම අයදුම්කරුවකු සඳහා ම පහත කරුණු අදාළ කර ගනු ලැබේ.

2.10.1 සෑම අයදුම්කරුවකු ම ඔවුන් ඉල්ලුම් කරනු ලබන ජාතික/පළාත් පාසල් අනුව ඉල්ලුම් කරනු ලබන විෂයයට හා මාධ්‍යයට අදාළව පුරප්පාඩු නොපවතින අවස්ථාවකදී සලකා බැලීම සඳහා ස්ථිර පදිංචි පළාතට අමතරව අතිරේක පළාතක් ඉල්ලුම් කළ හැකිය. ඒ අනුව ඒ අතිරේක පළාත අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

2.10.2 එසේ ඉල්ලුම් කරනු ලබන අතිරේක පළාත සලකා බලනුයේ ඉල්ලුම් කරනු ලබන විෂයයට හා මාධ්‍යයට ජාතික/පළාත් පාසල් පුරප්පාඩු නොමැති අවස්ථාවල දී පමණි.

2.10.3 මෙහිදී අතිරේක පළාත තුළ පවතින ගුරු පුරප්පාඩු සඳහා පළාත තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම් සිදුකර තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් පමණක් මෙම අයදුම්කරුවන් සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.

***සැලකිය යුතුයි*** :- නැගෙනහිර පළාත තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන් නොවන අයදුම්කරුවන් සඳහා අයදුම් කළ හැකි වනුයේ නැගෙනහිර පළාතේ විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි, තොරතුරු තාක්ෂණය, තාක්ෂණ විෂය ධාරාව හා උපදේශනය යන විෂයයන් සඳහා පමණි.

03. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

3.2 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

3.3 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව මෙම පත්වීමට අදාළ රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය ඔබ ලබා ගත යුතුය.

3.4 අංක 2310/29 දරන 2022.12.14 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

3.5 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා එහි සංශෝධනයන් හි සඳහන් විධිවිධානයන්ට ද එම සේවා ව්‍යවස්ථාව මින් මතුවට සිදුකරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම්වලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

04. **වැටුප් පරිමාණය :**

මෙම තනතුරට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව GE 01-2025 හි රු. 53,060-800x6-940x7-1080x2 රු.66,600/- (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණිය සඳහා මෙම වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන රු. 64,440/- වැටුපෙහි පිහිටුවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිය.

05. **අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් :**

5.1 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2025.06.30 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපාධියක් සමඟ **සටහන 6** හි සඳහන් කර ඇති සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

5.1.2 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය. ඉල්ලුම් කරනු ලබන විෂයයට අදාළව ස්වකීය උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් (Credit සංඛ්‍යාවෙන්) 1/3 ක් සම්පූර්ණ කළ අයවලුන් විය යුතුය.

***ඉතා වැදගත්:-*** ඉහත 5.1.1 වගන්තිය හා 5.1.2 වගන්තිය යන වගන්තිවල කොන්දේසිවලට අමතර වශයෙන් ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත කරුණු සැලකිල්ලට ගත යුතු ය.

- ස්වකීය උපාධියට අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු ය.
- උසස් පෙළ හා සාමාන්‍ය පෙළ විෂය නිර්දේශයන්ට අදාළව උපාධියෙහි පවතින විෂයය සන්ධාරයන් සුදුසුකම් පරීක්ෂා කිරීමේදී සලකා බලනු ලැබේ.
- ඉල්ලුම් කරනු ලබන විෂයයට අදාළව ප්‍රධාන විෂයයක් සහිත උපාධි නොමැති අවස්ථාවන්හි දී ලබා ඇති උපාධිය සමඟ අමතර සුදුසුකම් ද සලකා බලනු ලැබේ.
- උපාධියෙහි විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයෙහි (Transcript) විෂයය සන්ධාරය (credit සංඛ්‍යාව) සඳහන් නොවේ නම් එය අදාළ විශ්වවිද්‍යාලය මඟින් තහවුරු කර අදාළ ලේඛන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.
- උපාධියෙහි විෂයය සන්ධාරය පිළිබඳව ඇතිවන ගැටළු සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්/ අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.
- පාසල් පද්ධතියේ පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව අත්‍යාවශයෙන් බඳවාගත යුතු ලෙස හඳුනාගන්නා විෂයයන් සඳහා බඳවා ගැනීමේදී ප්‍රමුඛතාව ලබාදී කටයුතු කරනු ලබන බැවින් එක් අයදුම්කරුවකු අ.පො.ස (උසස් පෙළ) හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වූ විෂයයන් කාණ්ඩයෙන් විෂයයන් දෙකක් සඳහා සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අනෙකුත් විෂයයන් කාණ්ඩයෙන් විෂයයන් දෙකක් සඳහා ඉල්ලුම් කළ හැකිය.

5.1.3 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව සෑම අයදුම්කරුවකුම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා.පෙළ) විභාගය හා සමානව පිළිගනු ලබන වෙනත් විභාග සමතුන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

**සටහන 6**

පහත සඳහන් පරිදි එක් එක් විෂයය සම්බන්ධයෙන් එහි දක්වා ඇති සුදුසුකම් අවම සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

tamilguru.lk



1.අ.පො.ස (උසස් පෙළ) විෂයයන් හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වූ විෂයයන්

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 101 | රසායන විද්‍යාව<br>Chemistry | සිව් අවුරුදු විශේෂ උපාධියකදී ප්‍රධාන විෂයය ලෙස හෝ<br>අනෙක් විෂයයක් ලෙස උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස. (උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම හෝ<br>තුන් අවුරුදු උපාධියකදී මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් අදාළ විෂයෙන් සම්පූර්ණ කර තිබීම |
| 102 | භෞතික විද්‍යාව<br>Physics | සිව් අවුරුදු විශේෂ උපාධියකදී ප්‍රධාන විෂයය ලෙස හෝ<br>අනෙක් විෂයයක් ලෙස උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස. (උසස් පෙළ) විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම හෝ<br>තුන් අවුරුදු උපාධියකදී මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් අදාළ විෂයයෙන් සම්පූර්ණ කර තිබීම |
| 103 | ජීව විද්‍යාව<br>Biology | සිව් අවුරුදු විශේෂ උපාධියකදී ප්‍රධාන විෂයය ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හෝ සත්ව විද්‍යාව හදාරා තිබීම හා ප්‍රධාන විෂය උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව වන විට අනෙක් විෂයයක් ලෙස සත්ත්ව විද්‍යාව ද ප්‍රධාන විෂයය සත්ත්ව විද්‍යාව වන විට අනෙක් විෂයයක් ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව ද අවම වශයෙන් වසර දෙකකදී වත් උසස් පෙළ විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම හෝ<br>තුන් අවුරුදු සාමාන්‍ය උපාධියකදී උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන් දෙකෙහිම එකතුව, මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක බැගින් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම |
| 104 | කෘෂි විද්‍යාව<br>Agricultural Science | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management)<br>විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය (B.Sc. Agriculture)<br>විද්‍යාවේදී කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය (B.Sc. Agricultural Resources Management and Technology)<br>විද්‍යාවේදී කෘෂි ව්‍යාපාර කළමනාකරණ උපාධිය (B.Sc. Agri Business Management)<br>විද්‍යාවේදී අපනයන කෘෂිකර්ම උපාධිය<br>(B.Sc. Export Agriculture)<br>ඉහත නම් සඳහන් උපාධි හෝ<br>උසස් පෙළ කෘෂි විද්‍යාව විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම |
| 105 | සංයුක්ත ගණිතය<br>Combined Mathematics | සිව් අවුරුදු විශේෂ උපාධියකදී ප්‍රධාන විෂයය ලෙස ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හදාරා තිබීම හා ප්‍රධාන විෂයය ව්‍යවහාරික ගණිතය වන විට අනෙක් විෂයය ලෙස ශුද්ධ ගණිතය ද ප්‍රධාන විෂයය ශුද්ධ ගණිතය වන විට අනෙක් විෂයය ලෙස ව්‍යවහාරික ගණිතය ද අවම වශයෙන් වසර දෙකක දී වත් හදාරා තිබීම හෝ<br>තුන් අවුරුදු සාමාන්‍ය උපාධියකදී ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයන් දෙකෙහිම එකතුව, මුළු විෂයය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක බැගින් හදාරා තිබීම |
| 106 | ඉංජිනේරු තාක්ෂණවේදය<br>Engineering Technology | උපාධියෙහි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් සහිතව ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් යන විෂයය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි උපාධිය සම්පූර්ණ කර තිබීම හෝ<br>ඉංජිනේරු උපාධිය (ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හා/හෝ ඉලෙක්ට්‍රොනික්) ලබා තිබීම |
| 107 | ජෛව පද්ධති තාක්ෂණවේදය<br>Bio Systems Technology | විද්‍යාවේදී කෘෂි තාක්ෂණය හා කළමනාකරණ උපාධිය (B.Sc. Agricultural Technology and Management)<br>විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය (B.Sc. Agriculture)<br>විද්‍යාවේදී කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ උපාධිය (B.Sc. Agricultural Resources Management and Technology) ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය (BBST)<br>ඉහත නම් සඳහන් උපාධි හෝ<br>උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේදී උපාධියක් හදාරා තිබීම |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 108 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව<br>Science for Technology | විද්‍යාවේදී උපාධියෙහි පවතින මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් භෞතික විද්‍යාව අන්තර්ගත වන උපාධියක් හදාරා තිබීම |
| 109 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය<br>Information & Communication Technology | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විශේෂ උපාධියක් හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස ඇති උපාධියක්. උපාධි පාඨමාලාවට අයත් මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයට අයත් විය යුතුය. |
| 110 | ගිණුම්කරණය<br>Accounting | ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක් හෝ<br>ගිණුම්කරණය ප්‍රධාන විෂයයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 111 | ව්‍යාපාර අධ්‍යයනය<br>Business Studies | ව්‍යාපාර අධ්‍යයනය හෝ ව්‍යාපාර කළමනාකරණයට අදාළ විෂයයක් ප්‍රධාන විෂයයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 112 | ව්‍යාපාර සංඛ්‍යානය<br>Business Statistics | ව්‍යාපාර සංඛ්‍යානය ප්‍රධාන විෂයයක් වන හෝ සංඛ්‍යානය විෂයය ඇතුළත් වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 113 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය<br>Logic and Scientific Method | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 114 | ආර්ථික විද්‍යාව<br>Economics | ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ<br>ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයයක් වන වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 115 | භූගෝල විද්‍යාව<br>Geography | භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ)උපාධියක් හෝ<br>භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 116 | දේශපාලන විද්‍යාව<br>Political Science | දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ)උපාධියක් හෝ<br>දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 117 | ගෘහආර්ථික විද්‍යාව<br>Home Economics | ගෘහ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් හදාරා තිබීම හෝ<br>ඕනෑම උපාධියක් සමග අවුරුදු 2ක් හෝ ඊට වැඩි පාඨමාලා කාලයක් සහිතව අවම වශයෙන් NVQ 4 හෝ ඊට ඉහළ මට්ටමේ ගෘහ විද්‍යා ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අ.පො.ස උසස් පෙළ සඳහා ගෘහ ආර්ථික විද්‍යාව විෂය හදාරා ඒ හෝ බී සාමාර්ථ්‍යය ලබා තිබීම |
| 118 | ඉතිහාසය(ලංකා ඉතිහාසය සමඟ ඉන්දීය/යුරෝපා/ නූතන ලෝක)<br>History of Sri Lanka (Indian/ Europe / Contemporary) | ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>ඉතිහාසය ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 119 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය<br>Communication & Media Studies | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක් හෝ<br>සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 120 | බෞද්ධ ශිෂ්ටාචාරය<br>Buddhist Civilization | බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ අධ්‍යයනය බෞද්ධ දර්ශනය සහ පාලි යන විෂයයන්ගෙන් එක් විෂයයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සමත්වීම |
| 121 | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය Christian Civilization | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, ක්‍රිස්තියානි ධර්මය විෂයය සහිත සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 122 | හින්දු ශිෂ්ටාචාරය<br>Hindu Civilization | හින්දු ශිෂ්ටාචාරය, හින්දු ධර්මය විෂයය සහිත සාමාන්‍ය හෝ<br>විශේෂ උපාධියක් ලබා තිබීම |
| 123 | ඉස්ලාම් ශිෂ්ටාචාරය<br>Islamic Civilization | ඉස්ලාම් ශිෂ්ටාචාරය, ඉස්ලාම් ධර්මය විෂයය සහිත සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 124 | බුද්ධ ධර්මය<br>Buddhism | බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ අධ්‍යයනය බෞද්ධ දර්ශනය සහ පාලි යන විෂයයන්ගෙන් එක් විෂයයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සමත්වීම |
| 125 | හින්දු ධර්මය<br>Hinduism | හින්දු ශිෂ්ටාචාරය, හින්දු ධර්මය විෂයය සහිත සාමාන්‍ය හෝ<br>විශේෂ උපාධියක් ලබා තිබීම |
| 126 | ක්‍රිස්තියානි ධර්මය<br>Christianity | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, ක්‍රිස්තියානි ධර්මය විෂයය සහිත සාමාන්‍ය හෝ<br>විශේෂ උපාධියක් ලබා තිබීම |
| 127 | ඉස්ලාම්<br>Islam | ඉස්ලාම් ශිෂ්ටාචාරය, ඉස්ලාම් ධර්මය විෂයය සහිත සාමාන්‍ය හෝ<br>විශේෂ උපාධියක් ලබා තිබීම |
| 128 | චිත්‍ර කලාව<br>Art | චිත්‍ර කලා/ මූර්ති විෂයය සහ අදාළ විෂයය පිළිබඳ දෘෂ්‍ය කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>චිත්‍ර කලා/ මූර්ති විෂයය සහ අදාළ විෂයය පිළිබඳ ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති උපාධියක් ලබා තිබීම |
| 129 | නර්තනය (දේශීය)<br>Dancing (Traditional) | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම (පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන දේශීය නර්තන කුසලතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීමේ කොන්දේසිය යටතේ) |
| 130 | නර්තනය (භරත)<br>Dancing (Bharatha) | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |
| 131 | පෙරදිග සංගීතය<br>Oriental Music | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |
| 132 | කර්ණාටක සංගීතය<br>Carnatic Music | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |
| 133 | බටහිර සංගීතය<br>Western Music | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලා /ලලිත කලා/ ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති උපාධියක් ලබා තිබීම |
| 134 | නාට්‍ය හා රංගකලාව<br>Drama & Theatre | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම |

| විෂයය ක්ෂේත්‍ර අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 135 | සිංහල<br>Sinhala | සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>සිංහල ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 136 | දෙමළ<br>Tamil | දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>දෙමළ ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 137 | ඉංග්‍රීසි<br>English | ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>ඉංග්‍රීසි ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 138 | අරාබි<br>Arabic | අදාළ විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරණු ලැබූ විදේශ භාෂා උපාධියක් හෝ අදාළ විෂයයට විශේෂ උපාධියක් ලබා තිබීම |
| 139 | ප්‍රංශ<br>French | |
| 140 | චීන<br>Chinese | |
| 141 | ජපන්<br>Japanese | |
| 142 | ජර්මන්<br>German | |
| 143 | රුසියන්<br>Russian | |
| 144 | මැලේ<br>Malay | |
| 145 | හින්දි<br>Hindi | |
| 146 | කොරියන් Korean | |
| 201 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය<br>Child Psychology and Care | ළමා මනෝ විද්‍යාව විෂයයක් ලෙසට හැදෑරූ උපාධියක් හෝ ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 202 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය<br>Health and Social Care | සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී (විශේෂ) උපාධිය හෝ<br>සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 203 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා<br>Physical Education and Sport | විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) විශේෂ උපාධිය හෝ<br>ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ<br>ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 204 | ප්‍රාසංගික කලාව<br>Performing Arts | ප්‍රාසංගික කලා පිළිබඳ විශේෂ උපාධිය හෝ<br>ශාස්ත්‍රවේදී-විශේෂ (ප්‍රාසංගික කලා/ලලිත කලා/නර්තනය/සංගීතය) උපාධිය හෝ<br>නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය හෝ<br>අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංග කලාව) උපාධිය හෝ<br>ප්‍රාසංගික කලාව හෝ ලලිත කලාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 205 | කාර්ය සිද්ධි කළමනාකරණය<br>Event Management | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ කාර්ය සිද්ධි කළමනාකරණය පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ<br>කාර්ය සිද්ධි කළමනාකරණය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධියක් ලබා තිබීම |
| 206 | ශිල්ප කලා<br>Arts and Crafts | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී) හෝ<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය විශේෂ උපාධිය (චිත්‍ර කලා සහ ග්‍රැෆික්) හෝ<br>දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය හෝ<br>ශාස්ත්‍රවේදී හෝ ලලිත කලාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම (චිත්‍ර කලා/ග්‍රැෆික්/මූර්ති/දෘශ්‍ය හා තාක්ෂණික කලා යන විෂයයන් හෝ එක් විෂයයක් හෝ ප්‍රධාන ලෙස හදාරා තිබිය යුතුය) |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 207 | අභ්‍යන්තර නිර්මාණකරණය Interior Designing | ගෘහ නිර්මාණ ශිල්පය සඳහා වූ විද්‍යාවේදී උපාධිය හෝ නිර්මාණවේදී උපාධිය හෝ ගෘහ නිර්මාණ ශිල්පය සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය හෝ<br>අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 208 | විලාසිතා නිර්මාණකරණය Fashion Designing | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (රෙදිපිළි හා ඇඟලුම් කලා) හෝ<br>නිර්මාණවේදී උපාධිය හෝ<br>විලාසිතා නිර්මාණකරණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ උපාධිය හෝ<br>විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 209 | ග්‍රැෆික් නිර්මාණකරණය Graphic Designing | නිර්මාණවේදී උපාධිය හෝ<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර සහ ග්‍රැෆික්) හෝ<br>පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ<br>පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ<br>උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඇතුළත් උපාධියක් හෝ<br>පරිගණක විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ (ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක වටිනාකමකින් යුතු ග්‍රැෆික් නිර්මාණකරණය සහිත විෂයය කොටස් හදාරා සමත් වී තිබිය යුතුය.)<br>ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 210 | භූ දර්ශන නිර්මාණකරණය Landscaping | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී උද්‍යාන විද්‍යාව/ භූ දර්ශන නිර්මාණකරණය විෂයයක් වශයෙන් හදාරා තිබීම හෝ<br>භූ දර්ශන නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම |
| 211 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය Applied Horticultural Studies | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී උද්‍යාන විද්‍යාව/ භූ දර්ශන නිර්මාණකරණය විෂයයක් වශයෙන් හදාරා තිබීම හෝ<br>ව්‍යවහාරික උද්‍යාන විද්‍යාව ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම |
| 212 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය Livestock Product Studies | කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී සත්ත්ව විද්‍යාව/ පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය විශේෂීකරණය සහිතව හදාරා තිබීම හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය හෝ<br>සත්ත්ව නිෂ්පාදන හා ආහාර තාක්ෂණය/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම |
| 213 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය Food Processing Studies | ආහාර විද්‍යාව හා තාක්ෂණය උපාධිය හෝ<br>ආහාර විද්‍යා හා පෝෂණය පිළිබඳ උපාධිය හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී ආහාර විද්‍යාව/ ආහාර නිෂ්පාදන තාක්ෂණය විශේෂීකරණය සහිතව හදාරා තිබීම හෝ<br>ආහාර නිෂ්පාදන තාක්ෂණය හෝ ආහාර සැකසුම් තාක්ෂණවේදය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම |
| 214 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය Aquatic Resource Studies | ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය/ජලජ සම්පත් තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරා තිබීම හෝ<br>සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ<br>ධීවර හා සාගර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ<br>ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම |
| 215 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය Plantation Product Studies | අපනයන කෘෂිකර්මය පිළිබඳ උපාධිය හෝ<br>කෘෂි විද්‍යාව පිළිබඳ උපාධියකදී වැවිලි භෝග/වැවිලි බෝග නිෂ්පාදනය තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරා තිබීම හෝ<br>වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරා ඇති ඕනෑම විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 216 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය<br>Construction Studies | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ<br>ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ<br>තාක්ෂණවේදී උපාධිය හෝ<br>ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ වෙනත් ඕනෑම උපාධියක් හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අවුරුදු 2ක් හෝ ඊට වැඩි පාඨමාලා කාලයක් සහිතව හෝ අවම වශයෙන් NVQ 4 හෝ ඊට ඉහළ මට්ටමේ ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| 217 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය<br>Automobile Studies | තාක්ෂණවේදී උපාධිය (මෝටර් යාන්ත්‍රික) හෝ<br>විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය හෝ<br>මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 218 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය<br>Electrical and Electronic Studies | විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ<br>ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ<br>ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>විදුලි හෝ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 219 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය<br>Textile and Apparel Studies | නිර්මාණවේදී උපාධිය හෝ<br>පේෂකර්ම හා රෙදිපිළි පිළිබඳ ඉංජිනේරු විද්‍යා ප්‍රථම උපාධිය හෝ<br>තාක්ෂණවේදී උපාධිය හෝ<br>පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 220 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය<br>Metal Fabrication Studies | තාක්ෂණවේදී උපාධිය (යාන්ත්‍රික) හෝ<br>යාන්ත්‍රික තාක්ෂණවේදය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ සාමාන්‍ය උපාධිය හෝ<br>ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ලෝහ සැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| 221 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය<br>Aluminum Fabrication Studies | තාක්ෂණවේදී උපාධිය (සිවිල් / ඉදිකිරීම්/ යාන්ත්‍රික) හෝ<br>ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් හෝ<br>ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| 222 | පරිගණක දෘඩාංග සහ ජාලකරණය<br>Computer Hardware and Networking | වසර තුනක පාඨමාලා කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන්ට අදාළව විෂයය කොටස් හදාරා තිබීම) හෝ<br>වසර හතරක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන්ට අදාළව විෂයය කොටස් හදාරා තිබීම) හෝ<br>පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී/ තාක්ෂණවේදී උපාධියක් ලබා තිබීම හා එහි මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක වටිනාකමක් සහිතව පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර හදාරා සමත් වී තිබීම<br>විෂයය ක්ෂේත්‍ර<br>i) Computer Hardware vii) Arduino Technology<br>ii) Computer system Engineering viii) IT Security<br>iii) Computer Networks ix) Network Security<br>iv) Computer Architecture x) Information Security<br>v) Operating System xi) Cyber Security<br>vi) Electronics xii) Computer Hardware and Network related projects |
| 223 | නිෂ්පාදනය<br>Manufacturing | වසර තුනක කාලයකින් යුත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම |

| විෂයය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 224 | සංචරණය හා ආගන්තුක සත්කාර<br>Tourism & Hospitality | විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය හෝ<br>විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය හෝ<br>ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳව පරිපාලනවේදී උපාධිය හෝ<br>ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ<br>සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය හෝ<br>සංචාරක කළමනාකරණ උපාධිය හෝ<br>සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය හෝ<br>සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| 225 | සැපයුම් කළමනාකරණය<br>Logistic Management | උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස සැපයුම් කළමනාකරණය විෂය හදාරා තිබීම |
| 226 | අලෙවිකරණය<br>Marketing | අලෙවි කළමනාකරණය පිළිබඳව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව හෝ කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ වාණිජවේදී උපාධිය හෝ ප්‍රධාන විෂයයක් ලෙස අලෙවි කළමනාකරණය ඇතුළත් උපාධියක් ලබා තිබීම |

**2. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අනෙකුත් විෂයයන්**

| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 301 | ශිෂ්‍ය උපදේශනය<br>Counselling | මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා තිබීම හෝ<br>මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව පිළිබඳව සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම හෝ<br>ඕනෑම උපාධියක් සමඟ<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකින් ලබා ගත් එක් අවුරුද්දකට නොඅඩු උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක්, හෝ<br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකින් ලබා ගත් උපදේශනය පිළිබඳ වසරකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| 302 | විශේෂ අධ්‍යාපනය<br>Special Education | විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ උපාධියක් හෝ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ උපාධියක් හෝ විද්‍යාවේදී කථන හා ශ්‍රවණ විද්‍යා උපාධියක් තිබීම |
| 401 | විද්‍යාව<br>Science | රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් ඕනෑම විෂයයන් 03ක් උපාධි විෂයයන් ලෙස සමත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම |
| 402 | ගණිතය<br>Mathematics | විද්‍යාවේදී උපාධිය (භෞතිය විද්‍යා) හෝ<br>ප්‍රධාන විෂයයන්ට අන්තර්ගතව ගණිත සංරචක ආශ්‍රිත විෂයයන් අවම වශයෙන් මුළු විෂය සන්ධාරයෙන් (Credit සංඛ්‍යාවෙන්) 1/3ක් වන ලෙස ඇතුළත්ව තිබීම |
| 403 | සිංහල භාෂාව හා සාහිත්‍යය<br>Sinhala Language & Literature | සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>සිංහල ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 404 | දෙමළ භාෂාව හා සාහිත්‍යය<br>Tamil Language & Literature | දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>දෙමළ ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 405 | ඉංග්‍රීසි භාෂාව<br>English | ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>ඉංග්‍රීසි ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |

| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 406 | ඉතිහාසය<br>History | ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>ඉතිහාසය ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 407 | භූගෝල විද්‍යාව<br>Geography | භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 408 | පුරවැසි අධ්‍යාපනය<br>Civic Education | ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය (පුරවැසි අධ්‍යයනය හා ප්‍රජා පාලනය/දේශපාලන විද්‍යාව) හෝ<br>ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (පුරවැසි අධ්‍යයනය හා ප්‍රජා පාලනය/දේශපාලන විද්‍යාව) ඇතුළුව ලබා තිබීම |
| 409 | ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයනය<br>Business & Accounting Studies | වානිජ විෂය ධාරාවට අයත් ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 410 | ව්‍යවසායකත්ව අධ්‍යයනය<br>Entrepreneurship Studies | වානිජ විෂයය ධාරාවට අයත් ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 411 | ප්‍රංශ<br>French | ප්‍රංශ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 412 | හින්දි<br>Hindi | හින්දි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 413 | ජපන්<br>Japanese | ජපන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 414 | අරාබි<br>Arabic | අරාබි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 415 | ජර්මන්<br>German | ජර්මන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 416 | චීන<br>Chinese | චීන භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 417 | රුසියන්<br>Russian | රුසියන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 418 | කොරියන්<br>Korean | කොරියන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම |
| 419 | දෙවන භාෂාව (සිංහල)<br>2nd Language Sinhala | ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය හෝ<br>සාමාන්‍ය උපාධිය හා දෙවන භාෂාවක් ලෙස සිංහල නම් අ.පො.ස. (සා.පෙළ) සඳහා දෙමළ විෂයයක් ලෙස කර තිබිය යුතු අතර අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම |
| 420 | දෙවන භාෂාව (දෙමළ)<br>2nd Language Tamil | ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය හෝ<br>සාමාන්‍ය උපාධිය හා දෙවන භාෂාවක් ලෙස දෙමළ නම් අ.පො.ස. (සා.පෙළ) සඳහා සිංහල විෂයයක් ලෙස කර තිබිය යුතු අතර අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම |
| 421 | සංගීතය( පෙරදිග)<br>Music (Oriental) | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |

| විෂය ක්ෂේත්‍ර අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 422 | සංගීතය (අපරදිග)<br>Music (Western) | අදාළ උපාධිය හා අ.පො.ස උසස් පෙළ විභාගයේ බටහිර සංගීතය විෂය සඳහා A හෝ B සාමර්ථ්‍යයක් ලබා තිබීම හෝ<br>අදාළ උපාධිය සමඟ පහත සුදුසුකම්වලින් අවම වශයෙන් එක් සුදුසුකමක් සපුරා තිබීම<br>Pass in Grade VI or above in Practical and Theory exams conducted by one the following institutions.<br>Department of Examinations, Sri Lanka<br>Trinity College of Music, London<br>Royal Schools of Music, London<br>London College of Music<br>Institute of Western Music and Speech , Sri Lanka (IWMS) |
| 423 | සංගීතය (කර්ණාටක)<br>Music (Carnatic) | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |
| 424 | චිත්‍ර<br>Art | චිත්‍ර කලා/ මූර්ති විෂයය සහ අදාළ විෂයය පිළිබඳ දෘෂ්‍ය කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>චිත්‍ර කලා/ මූර්ති විෂයය සහ අදාළ විෂයය පිළිබඳ ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති උපාධියක් හෝ<br>අදාළ සාමාන්‍ය උපාධියේ මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් චිත්‍ර විෂයය සහිතව හා අ.පො.ස උසස් පෙළ චිත්‍ර කලා විෂයය සඳහා A හෝ B සාමර්ථ්‍යයක් ලබා තිබීම |
| 425 | නැටුම් (දේශීය)<br>Dancing (Oriental) | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම (පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන දේශීය නර්තන කුසලතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීමේ කොන්දේසිය යටතේ) |
| 426 | නැටුම් (භරත)<br>Dancing (Bharatha) | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසංගික කලා / ලලිත කලා/ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම |
| 427 | නාට්‍ය හා රංග කලාව (සිංහල/ දෙමළ)<br>Drama and Theatre | අදාළ විෂයය යටතේ ලබා ඇති ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ<br>අදාළ විෂයය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් ඉන්දියානු විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති, ප්‍රාසාංගික කලා / ලලිත කලා/ ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම |
| 428 | සාහිත්‍ය හා රසාස්වාදය (සිංහල)<br>Appreciation of Literary (Sinhala) | සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක් හෝ<br>සිංහල ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |

| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 429 | සාහිත්‍ය හා රසාස්වාදය (දෙමළ)<br>Appreciation of Literary (Tamil) | දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක් හෝ<br>දෙමළ ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 430 | සාහිත්‍ය හා රසාස්වාදය (ඉංග්‍රීසි)<br>Appreciation of Literary (English) | ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක් හෝ<br>ඉංග්‍රීසි ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 431 | සාහිත්‍ය හා රසාස්වාදය (අරාබි)<br>Appreciation of Literary (Arabic) | අරාබි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක් හෝ<br>අරාබි ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |
| 432 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය<br>Information & Communication Technology | තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විශේෂ උපාධියක් හෝ<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රධාන විෂයයක් ලෙස ඇති උපාධියක් ලබා තිබීම |
| 433 | කෘෂි හා ආහාර තාක්ෂණය<br>Agriculture & Food Technology | කෘෂිකර්ම පිළිබඳ විද්‍යාවේදී ඕනෑම උපාධියක් හෝ<br>ඕනෑම විද්‍යාවේදී උපාධියක දී/ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධියකදී මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් කෘෂිකර්ම විෂයෙන් සම්පූර්ණ කර තිබීම |
| 434 | ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය<br>Aquatic Bio resources Technology | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී ඕනෑම උපාධියක් හෝ<br>සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ<br>ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ<br>ඕනෑම විද්‍යාවේදී උපාධියකදී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් ජලජ ජීව සම්පත් තාක්ෂණය විෂයයෙන් සම්පූර්ණ කර තිබීම |
| 435 | ශිල්ප කලා<br>Art and Craft | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී) හෝ<br>දෘශ්‍ය කලා හා සැලසුම්කරණය විශේෂ උපාධිය (චිත්‍ර කලා සහ ග්‍රැෆික්) හෝ<br>දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය හෝ<br>ශාස්ත්‍රවේදී හෝ ලලිත කලාවේදී විශේෂ උපාධිය ලබා තිබීම (චිත්‍ර කලා/ග්‍රැෆික්/මූර්ති/ දෘෂ්‍ය හා තාක්ෂණික කලා යන විෂයයන් හෝ එක් විෂයයක් හෝ ප්‍රධාන ලෙස හදාරා තිබිය යුතුය) |
| 436 | ගෘහ ආර්ථික විද්‍යාව<br>Home Economics | ගෘහ ආර්ථික විද්‍යාව සාමාන්‍ය පෙළ A සාමර්ථ්‍යයක් හෝ අ.පො.ස. උසස් පෙළ ගෘහ ආර්ථික විද්‍යා විෂයය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සමත් වී තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක උපාධිධරයකු වීම හෝ<br>ගෘහ ආර්ථික විද්‍යාව සඳහා තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වෘත්තීය පුහුණු ආයතනයකින් අවුරුද්දකට නොඅඩු පාඨමාලාවක් හදාරා ඩිප්ලෝමාව හෝ සහතික පත්‍රය ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ඕනෑම විෂය ක්ෂේත්‍රයක් යටතේ උපාධිධරයකු වීම හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ගෘහ විද්‍යාව විෂයය සඳහා උපාධිධරයකු වීම |
| 437 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා<br>Practical and Technical Skills | අ.පො.ස උසස් පෙළ විද්‍යාව, ගණිතය, තාක්ෂණවේදය විෂය ධාරාවෙන් අවම වශයෙන් විෂයයන් 03ක් සමත් වී තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඕනෑම විෂයය ක්ෂේත්‍රයකින් උපාධිධරයකු වීම |

tamilguru.lk



| විෂය කේත අංකය | විෂයය | සුදුසුකම් |
|---|---|---|
| 438 | නිර්මාණකරණය හා තාක්ෂණය Design and Technology | අදාළ විෂයය ක්ෂේත්‍රයේ තාක්ෂණවේදී/ඉංජිනේරු උපාධිය ලබා තිබීම හා පාඨමාලා අන්තර්ගතයෙන් අවම වශයෙන් 1/3 ක් විෂයානුබද්ධ හැදෑරීම් සහිත වීම හෝ ජාතික තාක්ෂණ සහතික පත්‍රය, ජාතික උසස් තාක්ෂණ ඩිප්ලෝමාව හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක ඊට සමාන්තරව එක් අවුරුද්දකට නොඅඩු විෂයානු බද්ධ කාර්මික ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ඊට අදාළ සහතිකය ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඕනෑම විෂයය ක්ෂේත්‍රයකින් උපාධිධරයකු වීම |
| 439 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය Health and Physical Education | විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) ගෞරව උපාධිය හෝ<br>ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ලබා තිබීම |
| 440 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය Communication and Media Studies | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම |

**5.1.4. වයස් සීමාව:**
2023.02.10 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුය.

(ඒ අනුව 2005.02.10 දිනට හෝ ඊට පෙර හා 1983.02.10 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**5.1.5. අනෙකුත් අවශ්‍යතා :**

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වයස 2023.02.10 දිනය වන විට ද අනෙකුත් සියලුම සුදුසුකම් 2025.06.30 දිනය වන විට ද සම්පූර්ණ කර තිබිය යුතුය.
IV. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.
V. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතෙහි **අංක 04** යටතේ දක්වා ඇති II හා III කොටසෙහි අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර, අදාළ විශේෂ අවශ්‍යතාව හා පූර්ණ කාලීන ආබාධිත තත්ත්වයක් පවතී නම් එහි ස්වභාවය සනාථ කිරීම සඳහා වන රජයේ රෝහලක වෛද්‍ය නිලධරයකු වෙතින් ලබාගත් වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

*සටහන 7*

ඉහත 5.1.5 V වගන්තිය හි දක්වා ඇති විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවකු විභාගය සඳහා පෙනී සිටීමේ දී අවශ්‍ය විශේෂ පහසුකම් සලසා ගැනීමට විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන වෛද්‍ය සහතිකවල පිටපත් වලට අමතරව, පූර්ණ කාලීනව පවතින ආබාධිත තත්වයක් මත **සටහන** 4 යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට සුදුසුකම් ලබන අයෙක් නම් ඔවුන් පූර්ණ කාලීනව පවතින ආබාධිත තත්වයක් සහිත අයකු බව සනාථ කිරීමට හැකි සියලුම වෛද්‍ය සහතිකවල මුල් පිටපත් සමග සාමාන්‍ය පාසල් පද්ධතිය තුළ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය සඳහා සක්‍රියව දායක වීමට හැකි බවට සම්මුඛ පරීක්ෂණයට ආසන්න දිනක දී රජයේ වෛද්‍ය නිලධරයකු වෙතින් ලබාගනු ලබන වෛද්‍ය සහතිකයක් මගින් ද ඒ බව සනාථ කිරීම අවශ්‍ය වේ.

**06. අයදුම්කිරීමේ ක්‍රමය:**

6.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දැනුම් දෙනු ලැබේ.

මාර්ගගත අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**6.2 විභාග පටිපාටිය**

6.2.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

6.2.2 මෙම බඳවා ගැනීම් නිවේදනයේ අවසානයේ වන **උපලේඛන 04** හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් විභාගය පැවැත්වේ. අයදුම්කරු විසින් ඉල්ලුම් කරනු ලබන නගර **උපලේඛන 04** අනුවම විය යුතු අතර ඉල්ලුම් කරන ලද නගරය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහි ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

6.2.3 සෑම අයදුම්කරුවකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. විභාගය සඳහා පෙනී සිටින භාෂා මාධ්‍යය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) පත්වීම් විෂයයෙහි මාධ්‍යය ලෙස සැලකේ.

6.2.4 අයදුම්කරුවකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විෂයය, විෂයය සඳහා මනාප අනුපිළිවෙළ, ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය, විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

6.2.5 විභාගය ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් සමන්විත වේ. සෑම අයදුම්කරුවකුම ප්‍රශ්න පත්‍ර දෙක (02) ටම පෙනී සිටිය යුතුය. සාමර්ථ්‍ය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40%ක් ලබා ගැනීම අනිවාර්ය වේ.

6.2.6 එක් වරකදී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

6.3 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

6.4 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය.

6.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශපත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**07. විභාගයට පෙනී සිටීම :**

7.1 අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන 8*

අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස සලකනු නොලබන අතර විභාගය සමත්වීමම පත්වීම් ලැබීමට සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.

**08. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :**

8.1 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් තම අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**09. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :**

අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**10. විෂය නිර්දේශය :**

10.1 ලිඛිත විභාග

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. සුදුසුකම් ලැබීම සඳහා ප්‍රශ්න පත්‍ර දෙක සඳහා ම පෙනී සිටීම අනිවාර්යය වේ.

(i). අභියෝග්‍යතාව - කාලය පැය එකයි. (01) (ලකුණු 100 යි)

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව, ප්‍රමාණකරණය, කාලය හා අවකාශ අතර සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයා සතු කුසලතාව මිනුම් කිරීම අපේක්ෂා කෙරේ. බහුවරණ මාදිලියේ ප්‍රශ්න පනහ (50) කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

(ii). සාමාන්‍ය දැනීම - කාලය පැය එකයි. (01) (ලකුණු 100 යි)

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳ ඇති සාමාන්‍ය දැනුම හා/හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන, තාක්ෂණික, ගුරු අධ්‍යාපනය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් 2010 වර්ෂයෙන් පසුව සිදු කරන ලද දේශීය අධ්‍යාපන නවීකරණ පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ මාදිලියේ ප්‍රශ්න පනහ (50) කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

10.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

***සටහන 9***
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

***සැලකිය යුතුයි:-*** මෙම ගැසට් පත්‍රයේ 5.1.2 වගන්තිය අනුව ඉල්ලුම් කරනු ලබන විෂයයට/විෂයන්ට අදාළව ස්වකීය උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් (Credit සංඛ්‍යාවෙන්) 1/3 ක් සම්පූර්ණ කර තිබීම අවශ්‍ය අයදුම්කරුවන් ඒ බව තමා අධ්‍යාපනය ලද විශ්වවිද්‍යාලය වෙතින් ද සනාථ කරන ලද ලේඛනයක මුල්පිටපත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් ලබයි නම් එම පරීක්ෂණය මණ්ඩලයට සලකා බැලීම සඳහා ඉදිරිපත් කල යුතුය.

10.3 ප්‍රායෝගික පරීක්ෂණය

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා මිනිත්තු පහ (05) කට නොඅඩු කාලයක් ලබාදෙනු ලැබේ. මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| *අනු අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

***සටහන 10***
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

ගුරු වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.
*සැලකිය යුතුයි-* යම් අයදුම්කරුවකු මෙම *ගැසට්* නිවේදනයේ 2.8 වගන්තිය පරිදි ඉල්ලුම් කරනු ලබන පාසල් වර්ගය යටතේම විෂයයන් එකකට වඩා වැඩි ගණනක් සඳහා ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි නම්, අයදුම්කරු ප්‍රායෝගික පරීක්ෂණයට සුදුසුකම් ලබන සියලුම විෂයන්ට අදාලව හඳුනාගන්නා ලද මාතෘකාවන් යටතේ ඉදිරිපත් කිරීම සිදුකිරීමට සූදානම්ව සිටිය යුතුය., ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය අයදුම්කරුගේ මනාපයද සලකා ◌හඳුනාගන්නා ලද එක් මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීම සිදුකිරීමට අවස්ථාව ලබාදේ.

10.3.1 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

(i) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මිනිත්තු පහ (05) කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

(ii) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි. (25)

(iii) ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායකය සඳහා අවම වශයෙන් ලකුණු දෙක(02) බැගින් ලබා ගත යුතුය.

(iv) ප්‍රායෝගික පරීක්ෂණය ජාතික පාසල් සඳහා අයදුම්කරන අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් ද පළාත් පාසල් සඳහා අයදුම්කරන අයදුම්කරුවන් සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ද සිදු කරනු ලැබේ.

***සැලකිය යුතුයි:-*** මෙම *ගැසට්* නිවේදනයේ 10.3.2 වගන්තිය පරිදි විෂයයන් එකකට වඩා වැඩි ගණනක් සඳහා ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට සුදානම්ව සිටිය යුතු අයදුම්කරුවන් හට ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය අයදුම්කරුගේ මනාපයද සලකා හඳුනාගන්නා ලද එක් විෂයකට අදාල මාතෘකාවක් යටතේ සිය ඉදිරිපත් කිරීම් සිදුකිරීමට අවස්ථාව ලබාදීම සිදුකරනු ලැබේ.

10.3.2 නිර්ණායකයන් හි අරමුණු

(i) අරමුණ හා ප්‍රවිශ්ට වීම
සාර්ථකව පාඩමෙහි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

( ii) පෞරුෂය හා හඬ පාලනය
ගුරුවරයකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේදී මනා ලෙස හඬ පාලනය කිරීමට ඇති හැකියාව ඇගයීම.

(iii) සන්නිවේදනයේ පැහැදිලි බව
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

(iv) කාල කළමනාකරණය
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාව ඇගයීම.

(v) ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිත කිරීමේ හැකියාව ඇගයීම.

**11. විභාග ගාස්තු :**

11.1 විභාග ගාස්තුව රු. 2700/- (රුපියල් දෙදහස් හත්සියය) කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)

(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රිය කර ඇති බැංකු හර කාඩ්පතක් මඟින් (Through Any Bank Debit Card with Internet Transaction Facilities)

(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මඟින් ( Bank of Ceylon Online Banking Method)

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් ( Bank of Ceylon Teller Slip Payments)

***සටහන 11***
ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

11.2 ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

11.3 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ සිදු කරනු නොලැබේ.

**12. විභාග ප්‍රතිඵල :**

12.1 ලිඛිත විභාගයට පෙනී සිට විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලිඛිත විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ මුළු ලකුණුවල ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ අවසන් ප්‍රතිඵල ලේඛනය සකස් කරනු ලැබේ. ජාතික පාසල් සඳහා පමණක් අයදුම්කළ අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ද පළාත් පාසල් සඳහා පමණක් අයදුම් කරනු

ලබන අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙත ද ජාතික/ පළාත් පාසල් සඳහා අයදුම්කළ අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත හා අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙත ද ලබා දෙනු ඇත. පත්වීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනයක් දන්වා යැවූ පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

**13. අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :**

පහත උප ලේඛන (01, 02, 03, 04 හා 05) භාවිත කර මාර්ගගත අයදුම්පත සකසා තිබේ.

**උපලේඛනය 01**

| භාෂා මාධ්‍යය | කේත අංකය |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |
| ඉංග්‍රීසි මාධ්‍යය | 4 |

**උපලේඛනය 02**

| පාසල් වර්ගය | කේත අංකය |
|---|---|
| ජාතික පාසල් සඳහා පමණක් | 1 |
| පළාත් පාසල් සඳහා පමණක් | 2 |
| ජාතික පාසල් හා පළාත් පාසල් දෙවර්ගය ම සඳහා | 3 |

**උපලේඛනය 03**

| පළාත | කේත අංකය |
|---|---|
| බස්නාහිර පළාත | 01 |
| මධ්‍යම පළාත | 02 |
| දකුණු පළාත | 03 |
| උතුරු පළාත | 04 |
| නැගෙනහිර පළාත | 05 |
| වයඹ පළාත | 06 |
| උතුරු මැද පළාත | 07 |
| ඌව පළාත | 08 |
| සබරගමු පළාත | 09 |

**උපලේඛනය 04**

| දිස්ත්‍රික්කය/ නගරය | කේත අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුරය | 24 |
| කෑගල්ල | 25 |

උපලේඛනය 05

| විෂය කේත අංකය | විෂය | ජාතික පාසල් | | | පළාත් පාසල් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | බස්නාහිර පළාත | | | උතුරු මැද පළාත | | | උතුරු පළාත | | |
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 101 | රසායන විද්‍යාව | √ | √ | √ | √ | √ | √ | √ | | | | √ | √ |
| 102 | භෞතික විද්‍යාව | √ | √ | √ | √ | √ | √ | √ | √ | | √ | √ | √ |
| 103 | ජීව විද්‍යාව | √ | √ | | √ | √ | | | | | √ | √ | √ |
| 104 | කෘෂි විද්‍යාව | √ | √ | √ | | | √ | √ | | | √ | √ | |
| 105 | සංයුක්ත ගණිතය | √ | √ | √ | √ | √ | √ | √ | √ | | | √ | √ |
| 106 | ඉංජිනේරු තාක්ෂණවේදය | √ | √ | | √ | √ | | √ | | | | √ | |
| 107 | ජෛව පද්ධති තාක්ෂණවේදය | √ | √ | | √ | √ | | √ | | | | √ | |
| 108 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | √ | √ | | √ | √ | | √ | | | | √ | |
| 109 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | √ | | √ | √ | √ | √ | | | √ | | |
| 110 | ගිණුම්කරණය | √ | √ | √ | √ | √ | √ | √ | | | | √ | |
| 111 | ව්‍යාපාර අධ්‍යයනය | √ | √ | √ | | √ | √ | | √ | | | √ | |
| 112 | ව්‍යාපාර සංඛ්‍යානය | √ | √ | √ | √ | | | | | | | √ | |
| 113 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | √ | √ | | √ | √ | | | | | | √ | |
| 114 | ආර්ථික විද්‍යාව | √ | √ | √ | √ | √ | √ | √ | √ | | √ | √ | |
| 115 | භූගෝල විද්‍යාව | √ | √ | √ | | √ | | √ | | | √ | √ | |
| 116 | දේශපාලන විද්‍යාව | √ | √ | √ | √ | √ | | √ | √ | | | √ | |
| 117 | ගෘහ ආර්ථික විද්‍යාව | √ | √ | | √ | √ | | √ | | | | | |
| 118 | ඉතිහාසය(ලංකා ඉතිහාසය සමඟ ඉන්දීය/යුරෝපා/ නූතන ලෝක) | √ | √ | | | | | √ | √ | | | √ | |
| 119 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | √ | √ | √ | √ | √ | | √ | √ | | √ | √ | |
| 120 | බෞද්ධ ශිෂ්ටාචාරය | √ | | | √ | | | √ | | | | | |
| 121 | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | √ | | | | | | | | | | √ | |
| 122 | හින්දු ශිෂ්ටාචාරය | | √ | | | √ | | | √ | | | | |
| 123 | ඉස්ලාම් ශිෂ්ටාචාරය | | √ | √ | | √ | | | √ | | | √ | |
| 124 | බුද්ධ ධර්මය | √ | | | | √ | | √ | | | √ | | |
| 125 | හින්දු ධර්මය | | | | | √ | | | | | | | |
| 126 | ක්‍රිස්තියානි ධර්මය | √ | √ | | √ | | | | | | | √ | |
| 127 | ඉස්ලාම් | √ | √ | √ | | | √ | | | | | √ | |
| 128 | චිත්‍ර කලාව | | √ | | | | | √ | √ | | √ | | |
| 129 | නර්තනය (දේශීය) | | √ | | | | | | | | | √ | |
| 130 | නර්තනය (භරත) | √ | | | | | | | | | | | |
| 131 | පෙරදිග සංගීතය | | | | | | | | | | | | |
| 132 | කර්ණාටක සංගීතය | | | | | | | | | | | | |
| 133 | බටහිර සංගීතය | √ | | | | | | | | | | | |
| 134 | නාට්‍ය හා රංගකලාව | √ | √ | | | | | √ | | | √ | √ | |

| විෂය කේත අංකය | විෂය | ජාතික පාසල් | | | පළාත් පාසල් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | බස්නාහිර පළාත | | | උතුරු මැද පළාත | | | උතුරු පළාත | | |
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 135 | සිංහල | √ | √ | | √ | √ | | √ | | | | √ | |
| 136 | දෙමළ | √ | √ | | | | | | √ | | | √ | |
| 137 | ඉංග්‍රීසි | | √ | √ | √ | √ | √ | | | | √ | √ | |
| 138 | අරාබි | | √ | √ | | √ | | | | | | | |
| 139 | ප්‍රංශ | | √ | | √ | | | | | | | | |
| 140 | චීන | | | | √ | | | | | | | | |
| 141 | ජපන් | | | | √ | | | √ | | | | | |
| 142 | ජර්මන් | | | | √ | | √ | | | | | | |
| 143 | රුසියන් | | | | | | | | | | | | |
| 144 | මැලේ | | | | | | | | | | | | |
| 145 | හින්දි | | √ | | | | | | | | | √ | |
| 146 | කොරියන් | | | | | | | | | | | | |
| 201 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | | | | √ | √ | | √ | | | | √ | |
| 202 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | | | | | | | √ | | | | √ | |
| 203 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | | | | √ | √ | | √ | √ | | | | |
| 204 | ප්‍රාසංගික කලාව | | | | | | | | | | | √ | |
| 205 | කාර්ය සිද්ධි කළමනාකරණය | | | | √ | | | √ | | | | | |
| 206 | ශිල්ප කලා | | | | √ | √ | | √ | | | | | |
| 207 | අභ්‍යන්තර නිර්මාණකරණය | | | | √ | √ | | | | | | √ | |
| 208 | විලාසිතා නිර්මාණකරණය | | | | √ | √ | | √ | | | | √ | |
| 209 | ග්‍රැෆික් නිර්මාණකරණය | | | | √ | √ | | √ | | | | √ | |
| 210 | භූ දර්ශන නිර්මාණකරණය | | | | √ | √ | | √ | | | | √ | |
| 211 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | | | | √ | | | √ | | | | √ | |
| 212 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | | | | √ | | | √ | | | | √ | |
| 213 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | | | | | | | √ | | | | | |
| 214 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | | | | | | | √ | | | | √ | |
| 215 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | | | | | | |
| 216 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | √ | | | | | |
| 217 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | √ | | | | √ | |
| 218 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | √ | √ | | | √ | |
| 219 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | √ | | | | √ | |

| විෂය කේත අංකය | විෂය | ජාතික පාසල් | | | පළාත් පාසල් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | බස්නාහිර පළාත | | | උතුරු මැද පළාත | | | උතුරු පළාත | | |
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 220 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | √ | | | | √ | |
| 221 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | | | | √ | | | √ | | | | √ | |
| 222 | පරිගණක දෘඪාංග සහ ජාලකරණය | | | | √ | √ | | √ | | | | √ | |
| 223 | නිෂ්පාදනය | | | | √ | | | | | | | √ | |
| 224 | සංචරණය හා ආගන්තුක සත්කාර | | | | | √ | | √ | √ | | | √ | |
| 225 | සැපයුම් කළමනාකරණය | | | | √ | | | | | | | | |
| 226 | අලෙවිකරණය | | | | √ | √ | | | | | | | |
| 301 | ශිෂ්‍ය උපදේශනය | √ | √ | | √ | √ | √ | √ | √ | | | √ | |
| 302 | විශේෂ අධ්‍යාපනය | | | | √ | | | √ | | | | √ | |

| විෂය කේත අංකය | විෂය | නැගෙනහිර පළාත | | | මධ්‍යම පළාත | | | වයඹ පළාත | | | සබරගමු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 101 | රසායන විද්‍යාව | | | | √ | √ | | √ | √ | √ | √ | √ | √ |
| 102 | භෞතික විද්‍යාව | | | | √ | √ | | √ | √ | √ | √ | √ | √ |
| 103 | ජීව විද්‍යාව | | | | | √ | | √ | √ | | √ | √ | √ |
| 104 | කෘෂි විද්‍යාව | | | | √ | √ | | √ | √ | | √ | | |
| 105 | සංයුක්ත ගණිතය | | | | √ | √ | | √ | √ | √ | √ | √ | √ |
| 106 | ඉංජිනේරු තාක්ෂණවේදය | | | | | √ | | √ | √ | | √ | √ | |
| 107 | ජෛව පද්ධති තාක්ෂණවේදය | | | | √ | √ | | √ | √ | | √ | √ | |
| 108 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | √ | | | √ | √ | | √ | | | √ | √ | |
| 109 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | | | √ | √ | | √ | √ | | √ | √ | |
| 110 | ගිණුම්කරණය | | | | √ | √ | | √ | √ | √ | √ | √ | √ |
| 111 | ව්‍යාපාර අධ්‍යයනය | | | | √ | √ | | √ | √ | √ | √ | √ | √ |
| 112 | ව්‍යාපාර සංඛ්‍යානය | | | | √ | √ | | | | | √ | | |
| 113 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | | | | | | | √ | √ | | √ | | |
| 114 | ආර්ථික විද්‍යාව | √ | | | √ | √ | | √ | √ | | √ | √ | √ |
| 115 | භූගෝල විද්‍යාව | | | | √ | √ | | √ | √ | | √ | √ | |
| 116 | දේශපාලන විද්‍යාව | | | | √ | √ | | √ | √ | | √ | √ | |
| 117 | ගෘහ ආර්ථික විද්‍යාව | | | | √ | | | √ | √ | | √ | | |
| 118 | ඉතිහාසය(ලංකා ඉතිහාසය සමඟ ඉන්දීය/යුරෝපා/ නූතන ලෝක) | | | | √ | | | √ | √ | | √ | √ | |
| 119 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | | √ | | √ | √ | | √ | √ | | √ | | |

| විෂය කේත අංකය | විෂය | නැගෙනහිර පළාත | | | මධ්‍යම පළාත | | | වයඹ පළාත | | | සබරගමු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 120 | බෞද්ධ ශිෂ්ටාචාරය | | | | √ | | | √ | | | √ | | |
| 121 | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | | | | | | | √ | √ | | | | |
| 122 | හින්දු ශිෂ්ටාචාරය | | | | | √ | | | √ | | | √ | |
| 123 | ඉස්ලාම් ශිෂ්ටාචාරය | | | | | √ | | | √ | | | | |
| 124 | බුද්ධ ධර්මය | | | | √ | | | | | | √ | | |
| 125 | හින්දු ධර්මය | | | | | | | | | | | | |
| 126 | ක්‍රිස්තියානි ධර්මය | | | | √ | | | | | | | | |
| 127 | ඉස්ලාම් | | | | | √ | | | | | | √ | |
| 128 | චිත්‍ර කලාව | | | | | | | √ | √ | | √ | √ | |
| 129 | නර්තනය (දේශීය) | | | | | | | | √ | | √ | | |
| 130 | නර්තනය (භරත) | | | | | | | | | | | | |
| 131 | පෙරදිග සංගීතය | | | | | | | √ | | | √ | | |
| 132 | කර්ණාටක සංගීතය | | | | | | | | | | | | |
| 133 | බටහිර සංගීතය | | | | | | | √ | | | | | |
| 134 | නාට්‍ය හා රංගකලාව | | | | √ | √ | | √ | | | √ | | |
| 135 | සිංහල | | | | √ | √ | | √ | | | √ | | |
| 136 | දෙමළ | | | | | √ | | | √ | | | √ | |
| 137 | ඉංග්‍රීසි | | | | √ | | | | | √ | | | |
| 138 | අරාබි | | | | | | | | | | | | |
| 139 | ප්‍රංශ | | | | √ | | | | | | | | |
| 140 | චීන | | | | | | | | | | √ | | |
| 141 | ජපන් | | | | √ | | | | | | | | |
| 142 | ජර්මන් | | | | √ | | | | | | √ | | |
| 143 | රුසියන් | | | | | | | | | | | | |
| 144 | මැලේ | | | | | | | | | | | | |
| 145 | හින්දි | | | | | | | | | | | | |
| 146 | කොරියන් | | | | | | | | | | | | |
| 201 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | | | | √ | √ | | | | | √ | √ | |
| 202 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | | | | √ | | | | | | | √ | |
| 203 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | √ | | | √ | √ | | | | | | √ | |
| 204 | ප්‍රාසංගික කලාව | | | | √ | √ | | | | | √ | √ | |
| 205 | කාර්ය සිද්ධි කළමනාකරණය | | | | | √ | | | | | √ | | |
| 206 | ශිල්ප කලා | | √ | | √ | √ | | | | | √ | √ | |
| 207 | අභ්‍යන්තර නිර්මාණකරණය | | | | √ | √ | | | | | √ | | |
| 208 | විලාසිතා නිර්මාණකරණය | | | | √ | √ | | | | | √ | | |
| 209 | ග්‍රැෆික් නිර්මාණකරණය | | √ | | √ | √ | | | | | √ | | |
| 210 | භූ දර්ශන නිර්මාණකරණය | | √ | | √ | | | | | | √ | √ | |
| 211 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | | | | √ | | |

| විෂය කේත අංකය | විෂය | නැගෙනහිර පළාත | | | මධ්‍යම පළාත | | | වයඹ පළාත | | | සබරගමු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 212 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | | | | √ | | |
| 213 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | | | | √ | √ | |
| 214 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | | √ | | √ | √ | | | | | √ | | |
| 215 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | | | | √ | | |
| 216 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | | √ | | √ | √ | | | | | √ | √ | |
| 217 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | | √ | | √ | √ | | | | | √ | √ | |
| 218 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | | | | √ | √ | |
| 219 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | | | | √ | √ | |
| 220 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | | | | | √ | √ | |
| 221 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | | √ | | √ | √ | | | | | √ | | |
| 222 | පරිගණක දෘඪාංග සහ ජාලකරණය | | | | √ | √ | | | | | √ | | |
| 223 | නිෂ්පාදනය | | | | √ | | | | | | √ | | |
| 224 | සංචරණය හා ආගන්තුක සත්කාර | | | | √ | | | | | | √ | √ | |
| 225 | සැපයුම් කළමනාකරණය | | | | | | | | | | √ | | |
| 226 | අලෙවිකරණය | | | | √ | √ | | | | | √ | | |
| 301 | ශිෂ්‍ය උපදේශනය | | | | √ | √ | | √ | √ | | √ | √ | |
| 302 | විශේෂ අධ්‍යාපනය | √ | √ | | √ | √ | | √ | | | √ | √ | |

| විෂය කේත අංකය | විෂය | දකුණු පළාත | | | ඌව පළාත | | |
|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 101 | රසායන විද්‍යාව | √ | | | √ | √ | √ |
| 102 | භෞතික විද්‍යාව | √ | | √ | √ | √ | √ |
| 103 | ජීව විද්‍යාව | √ | | | | √ | √ |
| 104 | කෘෂි විද්‍යාව | | | | √ | | |
| 105 | සංයුක්ත ගණිතය | √ | | √ | | √ | |
| 106 | ඉංජිනේරු තාක්ෂණවේදය | | | | | √ | |
| 107 | ජෛව පද්ධති තාක්ෂණවේදය | | | | | √ | |
| 108 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | | | | √ | √ | |
| 109 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | √ | | √ | √ | |
| 110 | ගිණුම්කරණය | √ | | | √ | √ | |
| 111 | ව්‍යාපාර අධ්‍යයනය | √ | | | √ | √ | |

| විෂය කේත අංකය | විෂය | දකුණු පළාත | | | ඌව පළාත | | |
|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 112 | ව්‍යාපාර සංඛ්‍යානය | | | | √ | √ | |
| 113 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | | | | √ | | |
| 114 | ආර්ථික විද්‍යාව | | | | √ | √ | |
| 115 | භූගෝල විද්‍යාව | √ | √ | | √ | √ | |
| 116 | දේශපාලන විද්‍යාව | | | | √ | √ | |
| 117 | ගෘහ ආර්ථික විද්‍යාව | √ | | | √ | | |
| 118 | ඉතිහාසය (ලංකා ඉතිහාසය සමග ඉන්දීය/ යුරෝපා/නූතන ලෝක) | | | | √ | | |
| 119 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | √ | | | √ | √ | |
| 120 | බෞද්ධ ශිෂ්ටාචාරය | √ | | | √ | √ | |
| 121 | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | | | | | √ | |
| 122 | හින්දු ශිෂ්ටාචාරය | | √ | | | √ | |
| 123 | ඉස්ලාම් ශිෂ්ටාචාරය | | | | | √ | |
| 124 | බුද්ධ ධර්මය | | | | | | |
| 125 | හින්දු ධර්මය | | √ | | | | |
| 126 | ක්‍රිස්තියානි ධර්මය | √ | | | | √ | |
| 127 | ඉස්ලාම් | √ | √ | | | | |
| 128 | චිත්‍ර කලාව | √ | √ | | √ | √ | |
| 129 | නර්තනය (දේශීය) | | | | √ | | |
| 130 | නර්තනය (භරත) | √ | | | | √ | |
| 131 | පෙරදිග සංගීතය | | | | | | |
| 132 | කර්ණාටක සංගීතය | | | | √ | √ | |
| 133 | බටහිර සංගීතය | | | | | | |
| 134 | නාට්‍ය හා රංගකලාව | | | | √ | √ | |
| 135 | සිංහල | √ | | | √ | | |
| 136 | දෙමළ | | √ | | | √ | |
| 137 | ඉංග්‍රීසි | | | | √ | | |
| 138 | අරාබි | | | | | | |
| 139 | ප්‍රංශ | | | | | | |
| 140 | චීන | | | | | | |
| 141 | ජපන් | | | | | | |
| 142 | ජර්මන් | | | | | | |
| 143 | රුසියන් | | | | | | |
| 144 | මැලේ | | | | | | |
| 145 | හින්දි | | | | | | |
| 146 | කොරියන් | | | | | | |
| 201 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | √ | | | √ | √ | |
| 202 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | √ | | | √ | | |
| 203 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | √ | | | | | |
| 204 | ප්‍රාසංගික කලාව | | | | √ | √ | |

| විෂය කේත අංකය | විෂය | දකුණු පළාත | | | ඌව පළාත | | |
|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 205 | කාර්ය සිද්ධි කළමනාකරණය | | | | | √ | |
| 206 | ශිල්ප කලා | √ | | | | √ | |
| 207 | අභ්‍යන්තර නිර්මාණකරණය | | | | | √ | |
| 208 | විලාසිතා නිර්මාණකරණය | √ | √ | | √ | √ | |
| 209 | ග්‍රැෆික් නිර්මාණකරණය | √ | | | √ | | |
| 210 | භූ දර්ශන නිර්මාණකරණය | | | | √ | | |
| 211 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | | | | | √ | |
| 212 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | √ | √ | | | | |
| 213 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | | | | √ | √ | |
| 214 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | √ | | | √ | | |
| 215 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | √ | | | √ | √ | |
| 216 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | √ | √ | | √ | √ | |
| 217 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | √ | | | √ | √ | |
| 218 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | √ | | | | √ | |
| 219 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | √ | | | √ | √ | |
| 220 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | √ | | | | | |
| 221 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | √ | | | √ | √ | |
| 222 | පරිගණක දෘඪාංග සහ ජාලකරණය | √ | √ | | √ | | |
| 223 | නිෂ්පාදනය | √ | | | | | |
| 224 | සංචරණය හා ආගන්තුක සත්කාර | √ | √ | | √ | √ | |
| 225 | සැපයුම් කළමනාකරණය | | | | | | |
| 226 | අලෙවිකරණය | | | | | | |
| 301 | ශිෂ්‍ය උපදේශනය | √ | √ | | √ | √ | |
| 302 | විශේෂ අධ්‍යාපනය | √ | | | | √ | |

| විෂය කේත අංකය | විෂය | ජාතික පාසල් | | | පළාත් පාසල් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | බස්නාහිර පළාත | | | උතුරු මැද පළාත | | | උතුරු පළාත | | |
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 401 | විද්‍යාව | | | | √ | √ | √ | √ | | | √ | | √ |
| 402 | ගණිතය | | √ | | √ | √ | √ | √ | √ | √ | √ | √ | |
| 403 | සිංහල භාෂාව හා සාහිත්‍යය | √ | | | √ | | | √ | | | | | |
| 404 | දෙමළ භාෂාව හා සාහිත්‍යය | | | | | √ | | | | | | | |

| විෂය කේත අංකය | විෂය | ජාතික පාසල් | | | පළාත් පාසල් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | බස්නාහිර පළාත | | | උතුරු මැද පළාත | | | උතුරු පළාත | | |
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 405 | ඉංග්‍රීසි භාෂාව | | | | √ | √ | √ | | | | | √ | |
| 406 | ඉතිහාසය | √ | √ | √ | | | | √ | √ | | | √ | √ |
| 407 | භූගෝල විද්‍යාව | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| 408 | පුරවැසි අධ්‍යාපනය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| 409 | ව්‍යාපාර හා ගිණුම්කරණය | √ | | √ | √ | √ | √ | √ | | | | √ | √ |
| 410 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | √ | √ | √ | √ | | | √ | √ | | | √ | |
| 411 | ප්‍රංශ | | √ | √ | | | | | | | | | |
| 412 | හින්දි | | | √ | √ | | | | | | | | |
| 413 | ජපන් | | | √ | √ | | | | | | | | |
| 414 | අරාබි | | √ | √ | | | | | | | | √ | |
| 415 | ජර්මන් | | | √ | | | | | | | | | |
| 416 | චීන | | | | √ | | | | | | | | |
| 417 | රුසියන් | | | | | | | | | | | | |
| 418 | කොරියන් | | | | √ | | | | | | | | |
| 419 | දෙවන භාෂාව (සිංහල ) | | | | √ | | | | √ | | | √ | |
| 420 | දෙවන භාෂාව (දෙමළ) | √ | | √ | √ | | √ | √ | | | | | |
| 421 | සංගීතය ( පෙරදිග) | | √ | √ | √ | √ | | √ | | | √ | | |
| 422 | සංගීතය (අපරදිග) | | | √ | √ | √ | √ | | | | | | |
| 423 | සංගීතය (කර්ණාටක) | √ | | | | √ | | | | | | | |
| 424 | චිත්‍ර | | | | √ | √ | | √ | √ | | √ | √ | |
| 425 | නැටුම් (දේශීය) | | | | | √ | | √ | | | | | |
| 426 | නැටුම් (භරත) | √ | | | √ | √ | | | √ | | | √ | |
| 427 | නාට්‍ය හා රංග කලාව | | | √ | √ | √ | | | | | | | |
| 428 | සාහිත්‍ය හා රසාස්වාදය (සිංහල) | √ | √ | √ | √ | | | √ | | | | | |
| 429 | සාහිත්‍ය හා රසාස්වාදය (දෙමල) | √ | √ | √ | | √ | | | √ | | | √ | |
| 430 | සාහිත්‍ය හා රසාස්වාදය (ඉංග්‍රීසී) | √ | √ | √ | | | √ | | | √ | | | √ |
| 431 | සාහිත්‍ය හා රසාස්වාදය (අරාබි) | √ | √ | √ | √ | √ | | | √ | | | √ | |
| 432 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | √ | | √ | √ | √ | √ | √ | √ | √ | √ | |
| 433 | කෘෂි හා ආහාර තාක්ෂණය | | | √ | √ | √ | | √ | √ | | | √ | |
| 434 | ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය | √ | √ | | √ | | | | | | √ | | |
| 435 | ශිල්ප කලා | | | | √ | | | | | | | | |
| 436 | ගෘහ ආර්ථික විද්‍යාව | | | | √ | √ | | | | | √ | √ | |

| විෂය ක්ෂේත්‍ර අංකය | විෂය | ජාතික පාසල් | | | පළාත් පාසල් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | බස්නාහිර පළාත | | | උතුරු මැද පළාත | | | උතුරු පළාත | | |
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 437 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | √ | √ | √ | √ | √ | | √ | √ | | √ | √ | |
| 438 | නිර්මාණකරණය හා තාක්ෂණය | | | | √ | | | √ | | | | | |
| 439 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| 440 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | √ | √ | √ | √ | √ | | | √ | | √ | | |

| | විෂය ක්ෂේත්‍ර අංකය විෂය | නැගෙනහිර පළාත | | | මධ්‍යම පළාත | | | වයඹ පළාත | | | සබරගමු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 401 | විද්‍යාව | √ | √ | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| 402 | ගණිතය | √ | √ | √ | √ | √ | | √ | √ | √ | √ | √ | √ |
| 403 | සිංහල භාෂාව හා සාහිත්‍යය | √ | | | √ | | √ | √ | | | √ | | |
| 404 | දෙමළ භාෂාව හා සාහිත්‍යය | | √ | | | | √ | | √ | | | √ | |
| 405 | ඉංග්‍රීසි භාෂාව | √ | √ | | √ | √ | √ | | | √ | √ | √ | |
| 406 | ඉතිහාසය | √ | √ | | √ | √ | √ | √ | √ | | | √ | |
| 407 | භූගෝල විද්‍යාව | √ | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| 408 | පුරවැසි අධ්‍යාපනය | | | | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| 409 | ව්‍යාපාර හා ගිණුම්කරණය | | | | √ | √ | √ | √ | √ | | √ | √ | √ |
| 410 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | | | | √ | √ | | | | | √ | √ | |
| 411 | ප්‍රංශ | | | | | | √ | | | | | | |
| 412 | හින්දි | | | | | | | | | | | | |
| 413 | ජපන් | | | | √ | | | √ | | | √ | | |
| 414 | අරාබි | | | | | | | | | | | √ | |
| 415 | ජර්මන් | | | | | | | | | | | | |
| 416 | චීන | | | | | | | | | | √ | | |
| 417 | රුසියන් | | | | | | | | | | | | |
| 418 | කොරියන් | | | | √ | | | | | | √ | | |
| 419 | දෙවන භාෂාව (සිංහල ) | | | | | √ | √ | | √ | | | √ | |
| 420 | දෙවන භාෂාව (දෙමළ) | | | | √ | | √ | √ | | | √ | | |
| 421 | සංගීතය ( පෙරදිග) | | | | √ | √ | √ | √ | | | √ | | |
| 422 | සංගීතය (අපරදිග) | | | | √ | | √ | | √ | | | | √ |
| 423 | සංගීතය (කර්ණාටක) | | | | | | | | | | | √ | |
| 424 | චිත්‍ර | | √ | | √ | √ | | √ | √ | | √ | √ | |

| | විෂය කේත අංකය විෂය | නැගෙනහිර පළාත | | | මධ්‍යම පළාත | | | වයඹ පළාත | | | සබරගමු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 425 | නැටුම් (දේශීය) | | | | √ | √ | | √ | | | √ | | |
| 426 | නැටුම් (භරත) | | | | | √ | | | √ | | | √ | |
| 427 | නාට්‍ය හා රංග කලාව | | | | √ | √ | | | | | √ | √ | |
| 428 | සාහිත්‍ය හා රසාස්වාදය (සිංහල) | √ | | | √ | | | | | | √ | | |
| 429 | සාහිත්‍ය හා රසාස්වාදය (දෙමළ) | | √ | | | √ | | | | | | √ | |
| 430 | සාහිත්‍ය හා රසාස්වාදය (ඉංග්‍රීසි) | | | | | | | | | | | | √ |
| 431 | සාහිත්‍ය හා රසාස්වාදය (අරාබි) | | | | | √ | | | | | | √ | |
| 432 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | √ | | √ | √ | | √ | √ | √ | √ | √ | √ |
| 433 | කෘෂි හා ආහාර තාක්ෂණය | | | | √ | √ | | √ | √ | | √ | √ | √ |
| 434 | ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය | | | | √ | | | | | | | | |
| 435 | ශිල්ප කලා | | | | √ | | | √ | √ | | | √ | |
| 436 | ගෘහ ආර්ථික විද්‍යාව | | | | √ | √ | | √ | √ | | √ | √ | |
| 437 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | √ | | | √ | √ | | | | | √ | √ | |
| 438 | නිර්මාණකරණය හා තාක්ෂණය | | | | √ | | | √ | √ | | √ | | |
| 439 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | | √ | | √ | √ | | √ | √ | √ | √ | √ | √ |
| 440 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | | | √ | √ | √ | | √ | √ | √ | √ | √ | |

| විෂය කේත අංකය | විෂය | දකුණු පළාත | | | ඌව පළාත | | |
|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 401 | විද්‍යාව | | | √ | √ | | √ |
| 402 | ගණිතය | | √ | √ | √ | √ | √ |
| 403 | සිංහල භාෂාව හා සාහිත්‍යය | | | | | √ | |
| 404 | දෙමළ භාෂාව හා සාහිත්‍යය | | | | | | |
| 405 | ඉංග්‍රීසි භාෂාව | | | | | | √ |
| 406 | ඉතිහාසය | | √ | √ | √ | √ | √ |
| 407 | භූගෝල විද්‍යාව | √ | √ | √ | √ | √ | √ |
| 408 | පුරවැසි අධ්‍යාපනය | √ | √ | √ | √ | √ | √ |
| 409 | ව්‍යාපාර හා ගිණුම්කරණය | √ | √ | | √ | √ | |

| විෂය කේත අංකය | විෂය | දකුණු පළාත | | | ඌව පළාත | | |
|---|---|---|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 410 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | √ | √ | | √ | √ | |
| 411 | ප්‍රංශ | | | | | | |
| 412 | හින්දි | | | | | | |
| 413 | ජපන් | | | | | | |
| 414 | අරාබි | | | | | | |
| 415 | ජර්මන් | | | | | | |
| 416 | චීන | | | | | | |
| 417 | රුසියන් | | | | | | |
| 418 | කොරියන් | | | | | | |
| 419 | දෙවන භාෂාව (සිංහල ) | | | | | √ | |
| 420 | දෙවන භාෂාව (දෙමළ) | √ | | | √ | √ | |
| 421 | සංගීතය (පෙරදිග) | √ | √ | | √ | √ | |
| 422 | සංගීතය (අපරදිග) | | √ | | | √ | |
| 423 | සංගීතය (කර්ණාටක) | | √ | | | | |
| 424 | චිත්‍ර | √ | √ | | √ | √ | |
| 425 | නැටුම් (දේශීය) | | √ | | | | |
| 426 | නැටුම් (භරත) | √ | √ | | | √ | |
| 427 | නාට්‍ය හා රංග කලාව | | | | | √ | |
| 428 | සාහිත්‍ය හා රසාස්වාදය (සිංහල) | √ | | | √ | | |
| 429 | සාහිත්‍ය හා රසාස්වාදය (දෙමළ) | | √ | √ | | √ | |
| 430 | සාහිත්‍ය හා රසාස්වාදය (ඉංග්‍රීසි) | | | √ | | | √ |
| 431 | සාහිත්‍ය හා රසාස්වාදය (අරාබි) | | √ | | | √ | |
| 432 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | √ | √ | √ | √ | √ |
| 433 | කෘෂි හා ආහාර තාක්ෂණය | √ | √ | | √ | √ | |
| 434 | ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය | | | | | | |
| 435 | ශිල්ප කලා | | | | | | |
| 436 | ගෘහ ආර්ථික විද්‍යාව | | √ | | | √ | |
| 437 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | √ | √ | | √ | √ | |
| 438 | නිර්මාණකරණය හා තාක්ෂණය | | | | √ | | |
| 439 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | √ | √ | √ | √ | √ | √ |
| 440 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | | | | | √ | |

14. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බැලීමක් සිදු කරනු නොලැබේ.

15. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලැබේ.

16. ඔබ අයදුම්පතෙහි සඳහන් කරනු ලබන කිසිදු කරුණක් පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

17. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වන අතර කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවකින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය ජාතික පාසල් සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ද පළාත් පාසල් සඳහා ඒ ඒ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද සතු වේ.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් එවැනි විටක **සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි** සේ සලකා කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 පෙබරවාරි මස 02 වැනි දින.
ඉසුරුපාය,
පැලවත්ත,
බත්තරමුල්ල.

EOG 02-0016

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.